පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

11 ශ්‍රේණිය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I	කාලය පැය 01

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වලදී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. පහත දැක්වෙන්නේ එක් එක් පරිගණක පරම්පරා සම්බන්ධව සිසුවකු ඉදිරිපත් කරන ලද ප්‍රකාශයන් වේ.
   a. ට්‍රාන්සිස්ටරය (transistor) ප්‍රධාන දෘඩාංග තාක්ෂණ උපක්‍රමය වේ.
   b. මෙහෙයුම් පද්ධතියන් ආරම්භ වීම.
   c. යතුරු පුවරුව හා මූසිකය පළමුව භාවිතයට යොදා ගැනීම.
   d. ඇසෙම්බ්ලි භාෂාව මගින් පරිගණක ක්‍රමලේඛනය සිදු කිරීම.

   මේවායින් තෙවන පරිගණක පරම්පරාවේ ලක්ෂණ පමණක් අඩංගු පිළිතුරු වන්නේ,
   (1) a පමණි (2) b හා c පමණි (3) a ,c හා d පමණි (4)a, b හා d පමණි

2. පහත සඳහන් වන්නේ ද්විතීයික ආචයනය සඳහා යොදා ගන්නා උපකරණ වර්ග දෙකක් පිළිබඳ විස්තරයන් වේ. එම උපාංග දෙක නිවැරදිව දක්වා ඇත්තේ කුමන පිළිතුරේද?

   a. දත්ත සහ තොරතුරු තැන්පත් කිරීමට යොදා ගන්නා අතර මෙහි ඇති දත්ත සහ තොරතුරු කියවීම සහ ඒ මත ලිවීමට පරිශීලකයාට හැකිය. මෙම උපාංග පරිගණක තුළ ඇති අතර බාහිරින් ද පරිගණකය සම්බන්ධ කළ හැකි උපාංග ද ඇත. විශාල ධාරිතාවයන්ගෙන් යුත් උපාංග බහුලව දැකිය හැකියි.

   b. මෙම උපාංග ද ඉහල ධාරිතාවෙන් යුතු අතර දත්ත සහ තොරතුරු ආරක්ෂා කර තබා ගැනීම සඳහා පමණක්ම යොදා ගැනේ. බහුලව සර්වර් පරිගණකවල දත්ත හා තොරතුරු උපස්ථ කිරීමට යොදා ගනියි.

   (1) a- සංඛ්‍යාංක බහුවිධ තැටි, b -දෘඪතැටි
   (2) a- සංයුක්ත තැටි, b - චුම්භක පටි
   (3) a- දෘඪතැටි, b- චුම්භක පටි
   (4) a- චුම්භක පටි , b - සැණෙලි මතකය

3. පරිගණක මතකය පිළිබඳව පහත කුමන වගන්තිය නිරවද්‍ය වේ ද?
   1) ද්විතියික මතකය බාහිරව පවතින අතර එහා මෙහා ගෙනයා හැක.
   2) RAM,ROM සහ වාරක මතකය ප්‍රධාන මතකයට අයත්වේ.
   3) BIOS නෂ්‍ය වන අතර RAM හී පවතී.
   4) දෘඪතැටිය නෂ්‍ය නොවන අතර ඝන තත්ත්වය උපක්‍රමයකි.

4. පරිගණක මගින් සංඛ්‍යා දෙකක් එකතු කිරීමේදී දත්ත ගලායන අනුපිළිවෙල වන්නේ,

   (1) ආදාන උපක්‍රම ⟶ අංක ගණිත හා තාර්කික ඒකකය ⟶ ප්‍රතිදාන උපක්‍රම
   (2) අංක ගණිත හා තාර්කික ඒකකය ⟶ ආදාන උපක්‍රම ⟶ ප්‍රතිදාන උපක්‍රම
   (3) අංක ගණිත හා තාර්කික ඒකකය ⟶ ප්‍රතිදාන උපක්‍රම ⟶ ආදාන උපක්‍රම
   (4) ප්‍රතිදාන උපක්‍රම ⟶ අංක ගණිත හා තාර්කික ඒකකය ⟶ ආදාන උපක්‍රම

5. තොරතුරක ගුණාත්මක ලක්ෂණ හඳුනා ගැනීමට පහත දැක්වෙන එක් එක් අවස්ථාවන් සලකා බලන්න.

A- පන්තියක වැඩිම දින ගණනක් පැමිණි සිසුවා තේරීමේ දී පළමු හා දෙවන වාර වල පැමිණීම පමණක් සලකා බැලීම.

B- විදුහල්පති තුමා අවසන් වාර පරීක්ෂණයේ ගණිතය විෂය සඳහා ලකුණු හතළිහට අඩු පිරිස පිළිබඳ තොරතුරු විමසීමේදී දෙවනවාර පරීක්ෂණයෙන් ලකුණු පාදක කරගෙන තොරතුරු සැපයීම

C- පන්තියක සිසුන්ගේ පහසුකම් ගාස්තු පිළිබඳ ගණනය ගිණුම් පොත්වලින් රු. 2400 වෙනුවට රු.4200 ලෙස සටහන් වීම.

ඉහත එක් එක් අවස්ථාවන් වලදී කඩවී ඇති තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ පිළිවෙළින් දැක්වෙන පිළිතුරු කණ්ඩය වන්නේ,

(1) අංග සම්පූර්ණ බව, කාලීන බව , නිරවද්‍යතාවය
(2) නිරවද්‍යතාවය ,අදාල බව , අංග සම්පූර්ණ බව
(3) අංග සම්පූර්ණ බව , කාලීන බව , පිරිවැය අවම වීම
(4) පිරිවැය අවම වීම ,අදාල බව , අංග සම්පූර්ණ බව

6. පහත දැක්වෙන සංඛ්‍යා සලකන්න.

A – 01010.100 B- 02025.00

ඉහත සඳහන් සංඛ්‍යා යුගලයට අදාල වැඩිම වෙසෙසි බිටුව, අඩුම වෙසෙසි බිටුව, වැඩිම වෙසෙසි සංඛ්‍යාංකය, අඩුම වෙසෙසි සංඛ්‍යාංකය අනුපිළිවෙලින් දැක්වෙන්නේ,

	A		B	
	MSB	LSB	MSD	LSD
1	1	0	0	5
2	0	0	0	0
3	1	1	2	5
4	0	1	2	0

සිසුන් කිහිප දෙනෙකු විසින් ගණනය කර ලබාගත් 5F $_{16}$ ෂඩ් දශමය සංඛ්‍යාවට තුල්‍ය වන දශමය ,ද්විමය හා අෂ්ඨමය යන සංඛ්‍යාවන් පිළිතුරු පහත දැක්වේ.

A- 95 $_{10}$ B- 101001101 $_{2}$ C- 137 $_{8}$

මින් වඩාත් නිවැරදි වන්නේ ,

(1) B පමණි
(2) A හා B පමණි
(3) A හා C පමණි.
(4) A,B හා C සියල්ලම

8. දම්සිත් සතු ටෙරා බයිට් එකක (1 TB) මතක ධාරිතාවයක් සහිත දෘඩ තැටියකට සම්පූර්ණ ධාරිතාවයෙන් හරි අඩක් දැනටමත් ගොනු ආවයනය කර ඇති බව දෘඩතැටියේ මතක ධාරිතාවය පිරික්සීමේදී දැකගත හැකිවිය. ඔහුගේ දෘඩතැටියේ ඉතිරි මතක ධාරිතාවය නිවැරදිව දක්වන පිළිතුර වන්නේ,

(1) 2^1X2^{29} bytes (2) 2^9X2^{10} MB (3) 2^9X2^9 KB (4) $2^5X2^4X2^9$ MB

9. ASCII කේත ක්‍රමය අනුව A අකුරට අදාල ඇස්කි කේතය වන්නේ 1000001 වන අතර a අක්ෂරයට අදාල ඇස්කි දශමය අගය වන්නේ 97 නම් පහත දැක්වෙන ඇස්කි කේතයෙන් නිරූපණය වන වචනය වන්නේ කුමක්ද?

1000010 1100101 1100100

(1) Ced (2) cab (3) Bed (4) Bag

10. පහත විස්තර කරන්නේ පරිගණකයේ ඇති **සුවිශේෂී ලක්ෂණ** වේ.

(A) තත්පරයකදී මිලියනයකට වඩා වැඩි ප්‍රමාණයෙන් උපදෙස් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පරිගණකයට ඇත.

(B) පැය 24 පුරා එකම ආකාරයට ක්‍රියා කරමින් නිවැරදි තොරතුරු ලබා දීමේ හැකියාව පරිගණකයට ඇත.

(C) විවිධ වූ කාර්යයන් සඳහා යෙදවිය හැකි වීම පරිගණකයේ ඇති විශේෂ ලක්ෂණයකි.

ඉහත සඳහන් විස්තර අනුව පරිගණකයේ සුවිශේෂී ලක්ෂණ නිවැරදි ව පෙළගස්වා ඇත්තේ කුමන පිළිතුරේද?

(1) (A)- වේගය, (B)- කාර්යක්ෂමතාව, (C)-බහුකාර්යබව
(2) (A)-නිරවද්‍යතාව, (B)- කාර්යක්ෂමතාව (C)-වේගය
(3) (A)- බහුකාර්යබව, (B)- වේගය, (C)- කාර්යක්ෂමතාව
(4) (A)- කාර්යක්ෂමතාව, (B)- නිරවද්‍යතාව, (C)-වේගය

11. සේප්පුවක් විවෘත කිරීම සඳහා යතුරු තුනක් අවශ්‍යවේ. කළමනාකරුගේ යතුර, ගිණුම් හිමියාගේ යතුර හා ආරක්ෂක නිලධාරියාගේ යතුරක් යන්න එම යතුරු තුනය.මෙම යතුරු තුනම නොමැති විටකදී හෝ එක් යතුරක් නොමැති විටදී සේප්පුව විවෘත වන්නේ නැත.යතුරු තුනම තිබේ නම් පමණක් සේප්පුව විවෘතවේ. සේප්පුව විවෘත වීමට අදාළ මූලික මෙහෙයුම් තර්කනය කුමක්ද?

(1) AND (2) OR (3) NOT (4) NOR

12. රූපයේ දැක්වෙන විද්‍යුත් පරිපථය පහත කවර තාර්කික ද්වාරය හා තුල්‍ය වේද?



(1) NOT (2)OR (3) NAND (4) AND

13. පහත සඳහන් සත්‍යතා වගුවට ගැලපෙන විද්‍යුත් පරිපථය කුමක්ද?

(1)


(2)


(3)


(4)


A	B	C	A.B	B'.C	Q
0	0	0	0	0	1
0	0	1	0	1	0
0	1	0	0	0	1
0	1	1	0	0	1
1	0	0	0	0	1
1	0	1	0	1	0
1	1	0	1	0	0
1	1	1	1	0	0

14. වදන් සැකසුම් මෘදුකාංගය භාවිතයෙන් සකස් කරගත් ලිපියක අප තෝරා ගන්නා පාඨයක අකුරු තද පැහැගැන්වීම සඳහා භාවිතා කරන කෙටි මං යතුර කුමක්ද?

(1) Alt+Ctrl+B (2) Ctrl+B (3) Alt+B (4) Shift+B

15. ඉ සමර්පණ මෘදුකාංගයක් නොවන්නේ කුමක්ද?

(1) Apple Keynote
(2) Corel Presentation
(3) Libre Office Impress
(4) Open office Calc

16. පහත A සිට D දක්වා ඇති ලේබල මගින් විවිධ මෘදුකාංග හා වැඩසටහන් වර්ග පෙන්වනු ලබන අතර P සිට S දක්වා ඇති ලේබලයන් මගින් මෘදුකාංග හා වැඩසටහන් වලට උදාහරණයන් දක්වා ඇත. ඒවා නිවැරදි අනුපිළිවෙලින් ගැලපූ පසු ලැබෙන පිළිතුර වන්නේ,

A	නිදහස් හා විවෘත කේත මෘදුකාංගයකි.	P	සම්පාදක (compiler)
B	උපයෝගිතා වැඩසටහනකි.	Q	ප්‍රතිවෛරස් මෘදුකාංග
C	ඒක පරිශීලක මෙහෙයුම් පද්ධතියකි.	R	Ubuntu
D	ක්‍රමලේඛන භාෂා පරිවර්තන වැඩසටහනකි.	S	DOS

(1) A- R , B- S , C –Q , D- P
(2) A- Q , B- P , C –S , D- R
(3) A- R , B- Q , C –S , D- P
(4) A- P , B- S , C –R , D- Q

17. පහත සඳහන් සටහනින් දැක්වෙන්නේ පරිගණක, පරිශීලකයා හා පරිගණක පද්ධතිය අතර ඇති සම්බන්ධයයි. එහි A ,B හා C ලෙස නම්කර ඇති ලේබලයන් වලට වඩාත් ගැලපෙන පද ඇතුලත් වරණය වන්නේ ,

A	
B	
C	උපයෝගිතා වැඩසටහන්
දෘඩාංග	

(1) A-මෙහෙයුම් පද්ධති B-පරිශීලකයා C- යෙදවුම් මෘදුකාංග
(2) A- යෙදවුම් මෘදුකාංග B- මෙහෙයුම් පද්ධති C- පරිශීලකයා
(3) A- පරිශීලකයා B- යෙදවුම් මෘදුකාංග C- මෙහෙයුම් පද්ධති
(4) A- පරිශීලකයා B- මෙහෙයුම් පද්ධති C- යෙදවුම් මෘදුකාංග

18. A සිට C දක්වා වූ ලේබල් මගින් විද්‍යුත් ප්‍රදර්ශක මෘදුකාංගයක කදා පිරිසැකැසුමෙ (slide layout) ආකාරයන් කිහිපයක් දැක්වේ. එම නිරූපකයන් පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ කුමක්ද?



(1) A- ද්වි අන්තර්ගතය (Two content) , B- සන්සන්දනය (comparison), C- මාතෘකාව පමණි (Title only).

(2) A- සන්සන්දනය (comparison),B- මාතෘකාව හා අන්තර්ගතය(Title and content) ,C- හිස් කදාව (Blank slide)

(3) A- මාතෘකාව හා අන්තර්ගතය(Title and content), B- සන්සන්දනය(comparison) , C- මාතෘකාව පමණි(Title only).

(4) A – ද්වි අන්තර්ගතය(Two content), B- මාතෘකාව හා අන්තර්ගතය(Title and content), C- හිස් කදාව(Blank slide)

19. විද්‍යුත් පැතුරුම් පතක් තුළ පහත දැක්වෙන A සිට C දක්වා නම්කර ඇති කෙටි මං යතුරු සංයෝජන සලකා බලන්න.

A- Ctrl + ⟶ (right arrow key)

B - Home key

C- Ctrl + Home key

සක්‍රිය කෝෂය පිහිටි පේළිය ඔස්සේ A තීරුව වෙත ගමන් කිරීමට යොදාගත හැකි කෙටි මං යතුර හෝ යතුරු සංයෝජනයන් අයත් පිළිතුර වන්නේ කුමක්ද?

(1) A පමණි (2) B හා C පමණි. (3) A හා C පමණි. (4) සියල්ලම

20. පහත දැක්වෙන්නේ Y= X^2 +3X +7 වීජීය ප්‍රකාශනයකට අදාල ප්‍රස්ථාරයක් නිර්මාණය කිරීමේදී ඒ අක්ෂවලට අගයන් ලබා ගැනීමට සකස් කරන ලද විද්‍යුත් පැතුරුම් පත් කොටසකි.
ඉහත සමීකරණයේ Y අගය B2 කෝෂයට බලාගැනීමට ඇතුළත් කළ යුතු සමීකරණය වන්නේ කුමක්ද?

	A	B	C	D	E	F	G
1	X	-3	-2	-1	0	1	2
2	Y						
3							

(1)= (B1*2) + (B1*3)+7
(2)= (B1/2) + (B1+3)+7
(3)= (B1^2) + (B1*3)+7
(4)= (B1*B1 + (B1^3)+7

21. පහත දැක්වෙන විද්‍යුත් පැතුරුම්පත් කොටස සලකන්න. මෙම පැතුරුම්පතේ A3 කෝෂයේ අගය ලබාගැනීම සඳහා =(A1*A2)+$B1 සමීකරණය ඇතුළත් කර ඇත්තේ නම් කෝෂ පිටපත් කිරීමෙන් පසු C3 හා D3 යන කෝෂවල දැකිය හැකි අගයන් පිළිවෙලින් වන්නේ,

	A	B	C	D
1	10	5	15	10
2	3	4	5	6
3	35			
4				
5				

(1) 25 , 80 (2) 60 , 120
(3) 60, 80 (4) 80 , 65

- පහත දත්ත සමුදාය වගු ආශ්‍රයෙන් 22- 24 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

ශිෂ්‍ය වගුව

Ad_No	Name	Date_Of_Birth
100	Saman	2005
101	Nimal	2006
102	Piyal	1990

ක්‍රීඩා ශිෂ්‍ය වගුව

Sports_ID	Sport	St_count	Ad_No
5001	Cricket	11	100
5002	Football	16	100
5003	Volleyball	6	102

22. ඉහත ක්‍රීඩා ශිෂ්‍ය වගුවේ ඇති ක්ෂේත්‍ර ගණන හා රෙකෝඩ ගණන පිළිවලින්,

(1) 4, 4 (2) 4,3 (3) 3,4 (4) 3,3

23. ඉහත වගු දෙක ඇසුරෙන් ආගන්තුක යතුර සඳහා උදාහරණය කුමක්ද?

(1) ක්‍රීඩා ශිෂ්‍ය වගුව- Ad_No
(2) ක්‍රීඩා ශිෂ්‍ය වගුව - Sports
(3) ක්‍රීඩා ශිෂ්‍ය වගුව - Sports_ID
(4) ශිෂ්‍ය වගුව - Ad_No.

24. උපන් දිනය සඳහා වඩාත් සුදුසු දත්ත ප්‍රරූපය කුමක්ද?

(1) Date/Time (2) Number (3) Birth Date (4) ඉහත සියල්ලම.

25. තොරතුරු පද්ධති සංවර්ධන ආකෘති අතරින් දිය ඇලි ආකෘතියේ පමණක් දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,

(1) අවශ්‍යතා සරල මට්ටමෙන් හඳුනාගෙන පද්ධති සංවර්ධනය ආරම්භ කළ හැකිවීම.
(2) පෙර පියවරේදී ලබා ගත් දැනුම ඊළඟ පියවරට ආදේශනය කළ හැකිවීම.
(3) සංවර්ධනය පියවර වලදී පෙර පියවරට ගමන් කළ නොහැකි අතර ඒවායේ වෙනස්කම් ද සිදුකළ නොහැක
(4) පද්ධති සංවර්ධනය වන සෑම පියවරකදිම ප්‍රගතිය මැනගත හැකිවීම.

26. තොරතුරු සංවර්ධන ජීවන චක්‍රය විවිධ අදියරයන් වලට අදාල ප්‍රකාශයන් කිහිපයක් පහත දක්වා ඇත.

A- පද්ධති පරීක්ෂණ ක්‍රියාවලියේ දී ප්‍රථම වරට පරිශීලකයින් සම්බන්ධ වන්නේ ප්‍රතිග්‍රහණ පරීක්ෂණ අවස්ථාවේදිය.
B- අදියරමය පිහිටුවීමේ දී පැරණි පද්ධතිය වෙනුවට නව පද්ධතිය තෝරාගත් ප්‍රදේශයක සම්පූර්ණයෙන්ම ස්ථාපනය කර එහි සාර්ථකත්වය මත අනෙක් ප්‍රදේශ කරා ව්‍යාප්ත කරයි.
C- පද්ධතියේ දෝෂ නිරාකරණය කර ගැනීමේදී හඳුනා ගනු ලබන ප්‍රධාන දෝෂ වර්ග වන්නේ කේතන දෝෂයන් සහ සැලසුම් දෝෂයන් පමණකි.

ඉහත ප්‍රකාශයන් අතරින් සාවද්‍ය ප්‍රකාශය / ප්‍රකාශයන් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) B හා C පමණි. (4) A හා C පමණි

27. අන්තර්ජාල ක්‍රියාකාරීත්වය ගැන සඳහන් වන පහත ප්‍රකාශයේ a ,b හා c ලෙස නම් කරන ලද හිස්තැන් වලට වඩාත් ගැලපෙන පද අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

' අන්තර්ජාල ක්‍රියාකාරීත්වයන් .....a...... මගින් පාලනය වන අතර වෙබ් අඩවියක් අනන්‍යව හඳුනා ගැනීමට ......b..... යොදා ගනියි. අන්තර්ජාලයට සම්බන්ධ වන පරිගණක අනන්‍යව හඳුනා ගැනීමට ....c....... යොදා ගනියි.'

(1) a- ඒකාකාර සම්පත් නිශ්චායකය (URL), b - නියමාවලි (Protocol), c- IP ලිපින(IP address)
(2) a- නියමාවලි (Protocol) , b - IP ලිපින(IP address), c- ඒකාකාර සම්පත් නිශ්චායකය (URL)
(3) a- වසම් නාමය(Domain name), b- ඒකාකාර සම්පත් නිශ්චායකය (URL) , c- IP ලිපින(IP address)
(4) a- නියමාවලි (Protocol) , b - ඒකාකාර සම්පත් නිශ්චායකය (URL), c- IP ලිපින(IP address)

28. පරිගණක වල අතත්‍ය පරිසරයක් ගොඩනගා සේවා දායක පරිගණක තුළින් පරිගණක පරිශීලකයාට විශාල දත්ත මධ්‍යස්ථාන හරහා විවිධ සම්පත් සැපයීම සිදු කරනු ලබන වලාකුළු පරිගණක සංකල්පය වන්නේ කුමක්ද?

(1) IaaS (2) PaaS (3) SaaS (4) WWW service

29. හානිකර මෘදුකාංග වලින් පරිගණකය සහ පරිගණක ජාල ආරක්ෂා කර ගැනීම සඳහා ගත හැකි පූර්ව ක්‍රියාමාර්ග පහත සඳහන් ඒවායින් තෝරන්න.

a) ප්‍රතිවෛරස මෘදුකාංගයක් ස්ථාපනය කිරීම සහ එය යාවත්කාලීනව පවත්වා ගැනීම.
b) Guard/Shield/Auto Scan/Update නිරතුරුව ක්‍රියාත්මකව පවත්වා ගැනීම.
c) සෑම විටම නීත්‍යානුකූල මෘදුකාංග පමණක් ස්ථාපනය කිරීම
d) පරිපාලන ගිණුමට අමතරව තවත් පරිශීලක ගිණුම පවත්වා ගැනීම.

(1) a පමණි (2) a, b, සහ c පමණි
(3) a සහ b පමණි (4) a ,b,c සහ d සියල්ලම

30. වෙබ් අඩවිය ඇති වෙබ් පිටු........... මගින් එකිනෙක අතර සම්බන්ධතාව පවත්වා ගනී. හිස්තැනට වඩාත් ගැලපෙන යෙදුම වන්නේ,

(1) වෙබ් අතිරික්සුව
(2) ගොනු හුවමාරු නියමාවලිය
(3) අධි සන්ධාන
(4) විද්‍යුත් තැපැල

31. පහත ව්‍යාජ කේතය ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

```
Begin
A=2
While A<10 do
        B= A mod 2
        If B=0 then
        Print "*"
        End if
A=A+2
End while
End.
```

ඉහත ව්‍යාජ කේතයේ * සලකුණ අවස්ථා කීයක් ප්‍රතිදානය වෙයිද?

(1) 4 (2) 5 (3) 9 (4) 10

32. ඉහත ප්‍රකාශයේ mod වෙනුවට div ලෙස භාවිත කළේ නම් ප්‍රතිදානය කුමක්ද?

(1) 1
(2) 4
(3) 5
(4) * සලකුණ දර්ශනය නොවේ.

33. ක්‍රමලේඛ භාෂා සම්බන්ධව පහත වගන්ති වලින් නිවැරදි කුමන වගන්තිය/ වගන්තිද?

A. යන්ත්‍ර භාෂාවට සාපේක්ෂව උසස් මට්ටමේ ක්‍රමලේඛන භාෂා වල ක්‍රියාත්මක වේගය වැඩිවේ.
B. එසෙම්බ්ලි භාෂා යන්ත්‍ර මත යැපෙන භාෂා වේ.
C. යන්ත්‍ර භාෂාවකට භාෂා පරිවර්තන වැඩසටහන් අවශ්‍ය නොවේ.

(1) AB (2) A,C (3) B,C (4) A,B,C

34. පූර්ණ සංඛ්‍යා 5ක් ඇතුළත් කිරීමට අදාළ නිවැරදි කාරක රීතිය ඇතුළත් අරාව වන්නේ,

(1) Var A:=array [0..4] of integer;
(2) Var A:=array [0_4] of integer;
(3) Var A: array [0..4] of integer;
(4) Var A: array [0_4] of integer;

35. පහත ගැලීම් සටහනේ A=25 හා B=30 නම් ප්‍රතිදානය වන්නේ,

(1) A=30, B=30, C=60
(2) A=25, B=35, C=60
(3) A=30, B=25, C=60
(4) A=25, B=25, C=75



36. පහත සඳහන් ග්‍රාපික ගොනු ආකෘති වලින් ග්‍රාපික වල හානි නොවන සංකෝචන ගොනු ආකෘති මොනවාද?

(1) Jpeg (2) Png (3) Tiff (4) BMP

37. දිග පික්සල 350 ක් හා පළල පික්සල 250 කින් යුතු ග්‍රාපිකයක විභේදනය කොපමනද?

(1) 2^{250} (2) 2^{350} (3) 350+250 (4) 350X250

38. වෙබ් අඩවි නිර්මාණයේදී කේත ලිවීමට, දෝෂ පරීක්ෂාව හා දෝෂ නිවැරදි කිරීමට අදාළ භූමිකාව කුමක්ද?

(1) වෙබ් අඩවි නිර්මාපක
(2) සංස්කාරක
(3) ප්‍රකාශක
(4) වෙබ් අඩවි පරිපාලන

39. මුදල් ගෙවා ලබා ගත යුතු වෙබ් අඩවි සංස්කාරක මෘදුකාංගය වන්නේ,

(1) Kompozer
(2) Ckeditor
(3) Visual Studio
(4) bluegriffon

40. පහත දැක්වෙන Html කේත කොටස සලකන්න.එහි නිවැරදිවම කාරක රීතිය අනුව දැක්වෙන්නේ කවර පිළිතුර තුළද?

(1) Uva Province
(2) Uva Province
(3) Uva Province
(4) Uva Province

පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

11 ශ්‍රේණිය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II	කාලය පැය 02

- පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න 4 ක් ද ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමිවන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමිවේ.

I. පාසලක ශිෂ්‍යයන්ගේ පංතිකාමරය තුළ නාමලේඛනය ලකුණු කිරීම වෙනුවට ඇඟිලි සලකුණු සුපරීක්ෂණය භාවිත කිරීමට අදහස් කරයි.
එහිදී භාවිත වන ආදානයක් හා එයින් ලබා ගත හැකි තොරතුරක් ලියන්න.

II. පහත දැක්වෙන සංඛ්‍යා පද්ධති පරිවර්තන, පියවර සහිතව පැහැදිලිව සකස් කරන්න.
   a. 3210_8 යන අෂ්ටමය සංඛ්‍යාවට අදාළ ද්විමය අගය
   b. BC_{16} යන ෂඩ්දශමය සංඛ්‍යාවට අදාළ අෂ්ටමය අගය

III. පරිගණකයක පර්යන්ත උපාංග සම්බන්ධ කිරීමට පරිගණක කෙවෙනි භාවිත කරයි. පහත A,B,C,D අක්ෂරයන්ගෙන් දැක්වෙන වගන්ති සඳහා වඩාත් සුදුසු කෙවෙනිය කුමක්දැයි වරහන් තුළින් තෝරා අදාළ අක්ෂරය සමඟ ලියන්න.
(සමාන්තරගත කෙවෙනිය/ PS II කෙවෙනිය /ශ්‍රේණිගත කෙවෙනිය/RJ45 කෙවෙනිය/ HDMI කෙවෙනිය)
   A. රැහැන් සහිතව ජාලයකට පරිගණක සම්බන්ධ කිරීමට
   B. සිදුරු 25ක් සහිත කෙවෙනිය
   C. තුඩු 9ක් සහිත කෙවෙනිය
   D. මූසිකය සම්බන්ධ කළ හැකි කෙවෙනිය

IV. පහත P,Q,R මගින් වළාකුළු පරිගණක සේවා තුනක් දක්වා ඇත. X,Y,Z මගින් වළාකුළු පරිගණක සේවා වලට අදාළ කාර්ය තුනක් දක්වා ඇත.
P,Q,R සඳහා ගැළපෙන X,Y,Z ලේබල වෙනම ලියන්න.

P – යටිතල පහසුකම් සේවාවක් ලෙස Iaas	X - මෘදුකාංග නිර්මාණයට අදාළ පහසුකම් සපයයි
Q – මෘදුකාංග සේවාවක් ලෙස Saas	Y - දත්ත ආචයනයට පහසුකම් සලසයි
R - වේදිකා සේවාවක් ලෙස Paas	Z - අන්තර්ජාල තුළ මෘදුකාංග භාවිත කළ හැක

V. පද්ධති සංවර්ධන ක්‍රියාවලිය නිරූපණය කළ හැකි ක්‍රමවේදයක් ලෙස දියඇලි ආකෘතිය දැක්විය හැකිය.
   A. දියඇලි ආකෘතියේ ඇති දුර්වලතා දෙකක් ලියන්න.
   B. දියඇලි ආකෘතියට අමතරව ඇති පද්ධති සංවර්ධන ආකෘති 2ක් ලියන්න.

VI. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් එවන ලද එක්තරා විද්‍යුත් ලිපියක ශීර්ෂ පහත පරිදි වේ.
      To - රංග, පබසරා
      Cc - රවී, ෆාතිමා
      Bcc - තෙනුල, දීපානි
ඉහත ශීර්ෂ වලට අදාළ A,B,C,D වගන්ති සත්‍යයද අසත්‍යයද යන්න අදාළ අක්ෂරය සමඟ ලියන්න.
   A. රංගට ලිපිය ලද බවට පබසරාට දැකිය හැක.
   B. රවීට ලිපිය ලද බවට දීපානිට දැකිය හැක.
   C. තෙනුලට ලිපිය ලද බවට ෆාතිමාට දැකිය හැක.
   D. තෙනුලට ලිපිය ලද බවට දීපානිට දැකිය හැක.

VII. වදන් සැකසුම් මෘදුකාංගයක් මගින් නිර්මාණය කරන ලද එක්තරා ලේඛනයක කොටසක් A මගින්ද එය හැඩසව් ගැන්වීමෙන් පසු B මගින්ද පෙන්වා දී ඇත.

A- Sri Lanka historically known as Ceylon, and officially the Democratic socialist Republic of Sri Lanka, is an island country in South Asia.

B- Sri Lanka historically known as **Ceylon**, and officially the Democratic socialist ***Republic of Sri Lanka, is an island*** country in <u>South Asia</u>.

1 4 2 3

වදන් සැකසුම් මෘදුකාංග වල ඇති හැඩසව් ගැන්වීමේ මෙවලම් A සිට J දක්වා පහත දක්වා ඇත. අංක 1 සිට 4 දක්වා හැඩසව් ගැන්වීමේ කාර්යයට භාවිත කරන ලද මෙවලම් හඳුනාගෙන 1 සිට 4 දක්වා කාර්යයන් කිරීමට සුදුසු ලේබලය ඔබගේ පිළිතුරු පත්‍රයේ ලියන්න.
(අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි මෙවලම් දක්වා ඇති විට ලකුණු නොලැබේ.)



VIII. නවීන පන්නයට අයත් මෝටර් රථයක අනාරක්ෂිත අවස්ථා තුනක් සඳහා රතු පැහැති බල්බයක් දැල්වේ. එම ඕනෑම අවස්ථාවක් හෝ අවස්ථා කිහිපයක් සත්‍ය වූ විට බල්බය දැල්වේ. ඒවා නම් දොරවල් නිසි පරිදි වසා නොතැබීම (p), රියදුරු ආරක්ෂක පටි පැළඳීමෙන් වැළකීම (Q), එංජිමේ දෝශයක් ඇති බව පෙන්වීම(R).
ඉහත සංසිද්ධිය සඳහා සත්‍යතා වගුවක් පහත උපකල්පන භාවිතයෙන් ගොඩනගන්න.

- දොරවල් නිසි පරිදි වසා තැබීම 0 හා දොරවල් විවෘත වීම 1
- රියදුරු ආරක්ෂක පටි පැළඳීම 0 රියදුරු ආරක්ෂක පටි නොපැළඳීම 1
- එංජිමේ දෝශයක් නොමැති බව 0 එංජිමේ දෝශයක් ඇති බව 1

IX. ආංකිත ග්‍රාපික සම්බන්ධ පහත A – D දක්වා ප්‍රකාශ සලකා බලා ඒවා නිවැරදි නම් (√) ලකුණද වැරදි නම් (X) ලකුණද ඉංග්‍රිසි අක්ෂරය සමඟ ලියන්න.

A. RGB වර්ණ ආදේශක කඩදාසි මත රූප නිර්මාණයට භාවිත කරයි.
B. රාස්ටර් ග්‍රාපික වල පික්සල භාවිත කරයි.
C. ආංකිත ග්‍රාපිකයක මූලිකාංග පික්සල වේ.
D. පික්සලයට ඇති බිටු ගණන වැඩි වන විට ග්‍රාපිකයේ ගුණාත්මකබව අඩුවේ.

X. පහත ව්‍යාජ කේතයට අදාළ ප්‍රතිදානය ලියන්න.

```
Begin
        X=1
        Y=1
While X<10 do
        Print X
        Y=Y+2
        X=X+Y
End While
End.
```

2. එක්තරා සේවා ස්ථානයක සේවය කරනු ලබන සේවකයින්ගේ වැඩ කරනු ලබන පැය ගණන හා ඔවුන් වැඩ කරනු ලබන අති කාල පැය ගණන අනුව ඔවුන්ගේ වැටුප සකස් කරනු ලබන පැතුරුම්පත් කොටසක් පහත දැක්වේ.

- අතිකාල අනුපාතය යනු වැඩ කළ පැය ගණනෙන් 1 ½ ගුණයකි.

	A	B	C	D	E	F	G
1	සතියක වැඩ කළ යුතු පැය ගණන				38		
2	සේවක අංකය	නම	වැඩ කළ පැය ගණන	පැයක් සඳහා ගෙවන මුදල	අතිකාල අනුපාතය	අතිකාල පැයගණන	වැටුප
3	2194	නිමල්	45	75	112.5	7	3637.5
4	2195	කමල්	39	75	112.5	1	2962.5
5	2196	කසුන්	52	75	112.5	14	4425
6	2197	සුගත්	60	100	150	22	7100
7							
8							
9							
10	වැඩිම අතිකාල පැය ගණන					22	
11	අති කාලඅනුපාතය සාමාන්‍ය				121.88		
12							
13							

(i). නිමල්ගේ අතිකාල අනුපාතය ලබා ගැනිමට නම් **E3** කෝෂය තුළ ලිවිය යුතු සූත්‍රය කුමක්ද?

(ii). අතිකාල පැය ගණන ගණනය සිදු කරනුයේ සේවකයා වැඩ කළ පැය ගණනින් සතියක වැඩ කළ යුතු පැය ගණන අඩු කිරීමෙනි. නිමල්ගේ අතිකාල පැය ගණන ගණනයට **F3** කෝෂයේ සටහන් කළ යුතු සූත්‍රය කෝෂ යොමු භාවිත කරමින් ලියන්න.

(iii). නිමල්ගේ මුළු වැටුප ගණනය කිරීම සඳහා **G3** කෝෂය තුළ භාවිතා කළ හැකි සූත්‍රය කුමක්ද?(සේවකයාගේ වැටුප සකස් කරනුයේ සාමාන්‍ය පැය වැටුප සමඟ සමඟ අතිකාල පැය වැටුප එකතු කිරීමෙනි)

(iv). වැඩිම අති කාල පැය ගණන සෙවීම සඳහා **F10** කෝෂය තුළ ලිවිය යුතු සූත්‍රය =ශ්‍රිතය 1(කෝෂය1: කෝෂය2) අකාරයට ලියන්න.

(v). **E11** කෝෂය තුළ අතිකාල අනුපාතයේ සාමාන්‍ය අගය සෙවීමට භාවිතා කළ යුතු සූත්‍රය =ශ්‍රිතය2(කෝෂය3: කෝෂය4) අකාරයට ලිවීමට අදාල පද හඳුන්වන්න.

3. පරිගණක ග්‍රාපික මෘදුකාංග භාවිතයෙන් නිර්මාණය කරන චිත්‍ර හෝ රූප අංකිත ග්‍රාපික ලෙස හැඳින්වේ.

(i). පික්සලයට ඇත්තේ බිටු 7ක් නම් එහි වර්ණ ගණන කොපමණද යන්න ගණනය කර පෙන්වන්න.

(ii). ග්‍රාපික නිර්මාණයේදී භාවිත වන වර්ණ ආදේශ දෙක නම් කර ඒවාට අදාළ වර්ණ ලියන්න.

(iii). GIMP මෘදුකාංගයේ අයිකන 4ක් A තීරුවේ දක්වා ඇත. B තීරුවේ ඇත්තේ ඒවායේ සිදු කරන කාර්යය වේ. ඒවා පිළිවලින් ගලපන්න.

A		B
1		P එකම වර්ණයෙන් යුතු වූ එකට සම්බන්ධ වූ කොටස් තෝරා ගැනීමට
2		Q ග්‍රාපිකය අඳුරු කිරීමට හෝ තියුණු කිරීමට
3		R රූපයේ පසුබිම තෝරා ගැනීමට
4		S මූසිකය ආධාරයෙන් අවශ්‍ය කොටස අවශ්‍ය හැඩයෙන් තෝරා ගැනීම

(iv). සජීවිකරණයන් නිර්මාණයේදී භාවිත වන මූලිකරාමු වර්ග 4 නම් කරන්න.

(v). Audacity මෘදුකාංගයට අදාළ පහත රූපයේ A, B, C, D අයිකන/ පහසුකම නම් කරන්න.



4. "මිණි පා" ආයතනය පාවහන් සැපයුම්කරුවන්ගෙන් මිලට ගෙන පාරිභෝගිකයින්ට අලෙවි කරනු ලබන බදුල්ල නගරයේ ප්‍රධාන ව්‍යාපාර ආයතනයකි.ඔවුන් විසින් පවත්වාගෙන යනු ලබන දත්ත පාදකයෙන් උපුටාගත් කොටසකි. ඒ අනුව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පාවහන් වගුව(Shoe_table)

SHO_ID	BRAND	T_CODE	STOCK
S01	WITS	GO	70
S02	BEN	KB	60
S03	BATA	GN	70
S04	BATERNSE	GO	80
S05	PINKY	KG	40

වර්ග වගුව (Type_table)

T_CODE	TYPE
KB	Kids Boys
KG	Kids Girls
GN	Gens Normal
GO	Gens Office

සැපයුම් වගුව(Supply_table)

DATE	SUP_ID	T_CODE	SHO_ID	AMOUNT
25/01/03	001	KB	S02	20
25/01/05	003	GO	S04	30
25/01/07	002	GO	S01	20
25/01/07	003	KG	S05	40

සැපයුම්කරු වගුව(Supplier_table)

SUP_ID	NAME	TP_NO
001	D.HANSANA	071-2345671
002	C.DINARU	072-9876542
003	K.HESHAN	075-8967543

(i). ඉහත වගු අතරින් ප්‍රාථමික යතුරු සඳහා උදාහරණ 02ක් වගුවල නම සමඟ ලියන්න

(ii). ඉහත වගු අතරින් ආගන්තුක යතුරක් සඳහා උදාහරණයක් වගුවේ නම සමඟ ලියන්න

(iii). පහත දැක්වෙන ගණුදෙණු හේතුවෙන් යාවත්කාලීන වන වගුව/ වගුවෙහි නම සමඟ යාවත්කාලීන වන රෙකෝඩය/යන් ලියන්න.

a. ආයතනයේ කළමණාකාරිත්වය නව වසර ආරම්භයේ (LO-Ladies Office) කාන්තාවන් හට කාර්යාල පාවහන් වර්ගයක් හඳුන්වා දීමට අදහස් කරයි.

b. 2025/01/10 වන දින C . ඉඳුවර මහතා විසින් අළුතින් හඳුන්වා දුන් LO වර්ගයේ රන්පා (RANPA) සන්නම කාන්තා පාවහන් 50 සැපයීම.

(iv). ඉහත දත්ත පාදකයේ වර්ග වගුව , සැපයුම් වගුව හා සැපයුම්කරු වගුව අතර දැකිය හැකි සම්බන්ධය ලියන්න.

(v). 2025/ 01/15 දිනට මෙම ව්‍යාපාරයේ ඉතිරිව ඇති සපත්තු ප්‍රමාණයන් හා සපත්තු සැපයුම පිළිබඳ මුද්‍රණ පිටපත් ලබා ගැනීමට අදාල වන දත්ත පාදක පහසුකම ලියන්න.

5.

(i). පරිගණක ක්‍රමලේඛණයේදී ක්‍රමලේඛ පරිවර්තක/ භාෂා පරිවර්තක වල අවශ්‍යතාව කුමක්ද?

(ii). ක්‍රමලේඛ පරිවර්තක දෙකක් නම් කරන්න.

(iii). මුළු පවුල් ගණන 750 ක් වාසය කරන මිහිඳුපුර ග්‍රාමයේ ග්‍රාම නිළධාරී හට පවුල් වල ආර්ථික මට්ටම පිළි
වාර්තාවක් සකස් කිරීමට අවශ්‍ය වී ඇත.

මේ සඳහා ක්‍රමලේඛනයක් සැකසීමට ඔහු විසින් තීරණය කරයි.ආදාන ලෙස පවුලේ මාසික මුළු ආදාය
දෙන අතර එවිට ඔවුන්ගේ ආදායම අනුව අයත් කාණ්ඩය දැක්වීම සිදු කළ යුතුයි. එම කාණ්ඩ සකස් කි
යොදා ගන්නා දත්ත පහත දැක්වේ.

මාසික ආදායම	අයත් වන කාණ්ඩය
රු. 60000 හෝ ඊට වැඩි	පොහොසත්
රු. 30000>60000	සාමාන්‍ය
රු. 10000> 30000	දිළිඳු
රු.10000ට අඩු	ඉතා දිළිඳු

ග්‍රාම නිළධාරී මහතාට ක්‍රමලේඛය නිර්මාණය කිරීමට අදාළ

a. ව්‍යාජ කේතය

b. ගැලීම් සටහන නිර්මාණය කරන්න.

6. (i) පහත සඳහන් ඒකාකාර සම්පත් නිශ්චායකයේ(URL) A සිට D තෙක් ලේබල් කර ඇති කොටස් නම්

https://www.abc.lk/images/abc.jpeg

A B C D

(ii). පහත X තීරුව Y තීරුව සමග ගලපන්න. අදාළ ඉලක්කමට ගැළපෙන අක්ෂරය පිළිතුරු පත්‍රයේ (

X		Y	
1	වසම් නාමය	A	https://www.abc.lk
2	IP ලිපින	B	Mozilla firefox
3	විද්‍යුත් තැපැල් ලිපින E-mail	C	192.178.100.0
4	ඒකාකාර සම්පත් නිශ්චායකය URL	D	Filezilla
5	වෙබ් අතරික්සුව	E	URL, IP ලිපින බවට පරිවර්තනය කිරීම
6	වසම් නාම සේවා දායකය DNS	F	phylaeducation.com
7	සෙවුම් යන්ත්‍රය	G	nimal@gmail.com
8	ගොනු හුවමාරුව FTP	H	yahoo

(iii). පහත දැක්වෙන වෙබ් පිටුවෙහි HTML ප්‍රභවය එහි සමහර උසුලන නොමැතිව සහ 1 සිට 12 තෙක් ලෙ
රූපය 2හි දක්වා ඇත.
රූපය 2හි 1 සිට 12 තෙක් නිවැරදි උසුලන පහත ලැයිස්තුවෙන් තෝරා එක් එක් ලේබල අංකය සහ h
උසුලනය ලියා දක්වන්න.

ලැයිස්තුව(ol , u , th ,title , rowspan , colspan , sup , b ,ul , sub , href , herf ,caption ,h1 , hr,)

Computer programming

Computer programming or coding is the composition of sequences of instructions, called programs. that computers can follow to perform tasks. It involves designing and implementing algorithms, step-by-step specifications of procedures, by writing code in one or more programming languages

Types of Programming languages

1. Low level programming languages
    - Machine language
    - Assembly language
2. High-level programming languages
    - pascal
    - java

History

Details	programmer
Ada Lovelace	
1 st computer programmer.	

If you find more information click here

රූපය 1

```
<html><head><❶> program</❶></head>
<body>
<❷>Computer programming</❷>
<❸ size="5" color="Black">
<p><font face="arial" size="3">
<❹>Computer programming or coding is the composition of sequences of instructions,<br/>
called programs.</❹> that computers can follow to perform tasks. It involves designing <br/>
and implementing algorithms, step-by-step specifications of procedures, <br/>
by writing code in one or more programming languages </p>
<h3><❺>Types of  Programming languages </❺></h3>
<❻>
<li>Low level programming languages
<❼><li> Machine language</li>
 <li>Assembly language</li></❼> </li>
<li>High-level programming languages
<❼><li> pascal</li>
 <li> java</li></❼></li>
</❻>
<table border="5" cell padding="5" cell spacing="5">
<❽>History</❽>
<tr><❾>Details</❾><❾>programmer</❾></tr>
<tr><td>Ada Lovelace</td> <td ❿="2"><img src="Ada.jpg" width="150" hight="200"></td></tr>
<td>1 <⓫>st</⓫>computer programmer.</td></tr>
</table>
<p>If you find more information <a ⓬="www.wikipedia.org"> click here</a>
</body></html>
```

රූපය 2

07.පරිගණක පද්ධතියේ ආරක්ෂාව ගැන විමසීමේදී භෞතික මෙන්ම තාර්කික ආරක්ෂාවද වැදගත්වේ.

(i). පහත දක්වා ඇති එක් එක් අවස්ථාවන් සඳහා වන නෛතික ගැටළුව වරහන් තුළින් තෝරා ලියන්න.

A. පරිගනක සැනෙලි මතකයක, ජංගම දුරකතන වල ගබඩාකර ඇති දත්ත තොරතුරු ලබාගැනීම.

B. සංයුක්ත තැටි , කලාකෘති යනාදිය පිටපත්කර අලෙවිය.

C. හිමිකරුගේ අවසරයකින් තොරව නිර්මාණය වෙනත් නිර්මාණ සඳහා යොදාගැනීම.

D. ආයතනයක වෙබ් අඩවියක පරිශීලක නාම මුරපද යනාදිය උපක්‍රමශීලීව ලබාගෙන ආයතනික තොරතුරු ලබාගැනීම

පද ලැයිස්තුව - (වංචා, පෞද්ගලික දත්ත සොරාගැනීම , අනවසරයෙන් පරිගණක පද්ධති වලට පිවිසුම, බුද්ධිමය දේපල සොරාගැනීම)

(ii). අංකිත බෙදුම යනු කුමක්ද?

(iii). පරිගණක පද්ධතියේ භෞතික ආරක්ෂාව ගැන සැලකීමේදී පහත අවස්ථාවන් සඳහා වඩාත් යෝග්‍ය උපක්‍රමය නම් කරන්න.

a. පරිගණක ජාලය අනවසර ප්‍රවේශ කරුවන්ගෙන් ආරක්ෂා කිරීම

b. පරිගණකයේ දත්ත හදිසි විදුලි විසන්ධිවීම් වලින් ආරක්ෂා කර ගැනීම.

(iv). පරිගණකය භාවිතයේදී නිවැරදි ඉරියව් වැදගත්වේ.පහත දැක්වෙන එක් එක් රෝග ලක්ෂණය හඳුනාගත හැකි සෞඛ්‍යය ගැටළුව වරහන් තුලින් තෝරා ලියන්න.

P. උරහිසේ සිට ඇඟිලි දක්වා ඇතිවන වේදනාකාරී තත්වය

Q. මැණික් කටුව ආශ්‍රිත වේදනාකාරී තත්වය

R. ඇස් වියලීම ,රතුවීම , කඳුලු ගැලීම

S. නින්ද නොයාම, ආහාර අරුචිය හා වෙහෙසකර බව.

(පරිගණක දෘෂ්ටි සහලක්ෂණය, පුනර්වර්තී ආතති පීඩා ,ආතතිය , හෘදයාබාධ , කාපල දෝනා සහලක්ෂණය, හිසේකැක්කුම)

(v). පරිගණක අපරාධ හා සයිබර් අපරාධ සම්බන්ධව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ආයතන දෙකක් නම් කරන්න.

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

පෙරහුරු පරීක්ෂණය - 2024(2025)

Grade 11 | Information Communication Technology- I,II | පිළිතුරු පත්‍රය

පිළිතුරු පත්‍රය

1- කොටස

ප්‍රශ්න අංක	පිළිතුරු අංක	ප්‍රශ්න අංක	පිළිතුරු අංක	ප්‍රශ්න අංක	පිළිතුරු අංක	ප්‍රශ්න අංක	පිළිතුරු අංක
01	2	11	1	21	4	31	1
02	3	12	4	22	2	32	4
03	2	13	2	23	1	33	3
04	1	14	2	24	1/2	34	3
05	1	15	4	25	3	35	4
06	3	16	3	26	1	36	2
07	3	17	3	27	4	37	4
08	2	18	1	28	1	38	2
09	3	19	2	29	4	39	3
10	1	20	3	30	3	40	3

2- කොටස

ප්‍රශ්න අංකය	අනු අංකය	පිළිතුර	ලකුණු	මුළු ලකුණු
01	i	ආදාන -ඇඟිලි සලකුණ ප්‍රතිදාන- මාසික පැමිණි දින ගණන / සතියක පැමිණි දින ගණන / මාසික නොපැමිණි දින ගණන / සතියක නොපැමිණි දින ගණන	1 x 2	02
	ii	a. 3 2 1 0 011 010 001 000_2 b. B C $_{16}$ 10 11 1 100 2 7 4_8	01 01	02
	iii	A-RJ45 B- සමාන්තර C- ශ්‍රේණිගත D- PS2	0.5 x 4	02
	iv	P- Y Q- Z R- X	02	02
	v	A-මුල් පියවරට ගමන් කළ නොහැක / අවසන් ප්‍රතිඵලටය ලැබීමට කාලයක් වැය වීම/අතර මැද දි වෙනස් කම් සිදු කිරීමට නොහැක. B- සර්පිල , පුනර්කරණ වෘද්ධි , මූලාදර්ශ	0.5 x 2 0.5 x 2	02
	vi	A- සත්‍ය B-සත්‍ය C- අසත්‍ය D- අසත්‍ය	0.5 x 4	02
	vii	1- B 2- E 3- A 4- G	0.5 x 4	02
	viii	(truth table below)	02	02

P	Q	R	Out put
0	0	0	0
0	0	1	1
0	1	0	1
0	1	1	1
1	0	0	1
1	0	1	1
1	1	0	1
1	1	1	1

	ix	A- X B-√ C-√ D- X	0.5 x 4	02
	x	1,4,9	02	02
			මුළු ලකුණු	20
02	i	=D3*1 ½ or =D3 * 1.5	02	
	ii	=C3- E$1	02	
	iii	=(E$1*D3)+(F3*E3)	02	
	iv	=Max(F3:F6)	02	
	v	=average(E3:E6) Formula - =average Cell 1 - E3 Cell 2 – E6	02	
			මුළු ලකුණු	10
03	i	වර්ණ = 2 ^{bpp} $=2^7$ =128	02	02
	ii	RGB-Red ,Green,Blue CMYK- Cyan ,Magenta , Yellow ,Black	1x 2	02
	iii	1- S 2- R 3- Q 4- P	0.5 x 4	02
	iv	රාමු, මූලික රාමු , ව්‍යුක්ත මූලික රාමු , ටිවීන් රාමුව	0.5 x 4	02
	v	A- Play B-S top C- Back D - Record	0.5 x 4	02
			මුළු ලකුණු	10
04	I	පාවහන් වගුව - SHO_ID වර්ග වගුව- T_CODE සැපයුම්කරු වගුව- SUP_ID	1x2	02
	ii	සැපයුම් වගුව- SUP_ID සැපයුම් වගුව-T_CODE සැපයුම් වගුව-SHO_ID	1x2	02
	iii	a-වර්ග වගුව (LO, Ladies office) b. සැපයුම්කරු වගුව (004 , C.Induwara,---) පාවහන් වගුව - (S06, Ranpa , LO , 50) සැපයුම් වගුව - (2025/01/10, 004,LO ,S06, 50)	01 02	03
	iv	බහු -බහු සම්බන්ධය	02	02
	v	වාර්තා	01	01
			මුළු ලකුණු	10
05	i	ඉහළ මට්ටමේ ක්‍රමලේඛන භාෂාවකින් හෝ ඇසෙම්බ්ලි භාෂාවෙන් ලියන ලද ක්‍රමලේඛනයක් යන්ත්‍රභාෂාව බවට පත්කිරීම	02	02
	ii	අර්ථ විනාසක , සම්පාදක , ඇසෙම්බ්ලර්	1*2	02

	iii	BEGIN
		count=1
		WHILE count <=750 DO
		INPUT income
		IF income <=10000 THEN
		Group =”Very poor”
		ELSE
		IF income <=30000 THEN
		Group =”poor”
		ELSE
		IF income <=60000 THEN
		Group =”normal”
		ELSE
		Group=”Rich”
		ENDIF
		ENDIF
		ENDIF
		DISPLAY Group
			03	03

[Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!]

		Count=count+1 ENDWILE END.		

	හෝ	BEGIN
		INPUT income
		IF income <=10000 THEN
		Group =”Very poor”
		ELSE
		IF income <=30000 THEN
		Group =”poor”
		ELSE
		IF income <=60000 THEN
		Group =”normal”
		ELSE
		Group=”Rich”
		ENDIF
		ENDIF
		ENDIF
		DISPLAY Group
		END.		

	හෝ	BEGIN
		INPUT income
		IF income <=10000 THEN
		Display “Very poor”
		ELSE
		IF income <=30000 THEN
		Display ”poor”
		ELSE
		IF income <=60000 THEN
		Display ”normal”
		ELSE
		Display”Rich”
		ENDIF
		ENDIF
		ENDIF
		END.		

		ව්‍යාජ කේතයට ගැලපෙන ගැලීම් සටහනට ලකුණු ලබා දෙන්න.	03	03
			මුළු ලකුණු	10
06	i	A- නියමාවලි B- සේවාව C-වසම් නාමය D- සම්පත් ගොනුව	0.5 x 4	02
	ii	1- F , 2- C , 3- G, 4-A , 5- B, 6-E , 7- H , 8- D	0.25 x 8	02
	iii	1- Title 2- h1 3- hr 4- b 5- U 6- ol 7- UL 8- caption 9- th 10- rowspan 11- sup 12-href	0.5x12	06
			මුළු ලකුණු	10
07	i	A- පෞද්ගලික දත්ත සොරාගැනිම C -බුද්ධිමය දේපල භාවිතය B - වංචා D- අනවසරයෙන් පද්දති වලට පිවිසිම	0.5x4	02
	ii	ICT භාවිතයට ඇති පහසුව හැකියාව හැසිරවිමේ දැනුම මිනිසා ආර්ථික සමාජීය වශයෙන් දුරස්ථවතිබිමයි		02
	iii	a-ගිණි පවුරු b- UPS අනවරත ජව සැපයුම	01 01	02
	iv	P-RSI Q- CTS R- CVS S-ආතතිය	0.5x4	02
	v	CERT ICTA ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	1x2	02
			මුළු ලකුණු	10

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
[Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!]

PARCEL NO

LOL.lk
BookStore

විභාග ඉලක්ක

පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න

කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න